# පරිසර කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්හි ඇති දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ටී.ජී.එස්.අයි. මධුහංසි* [1]

අප වටා ඇති වටපිටාව පරිසරය යි. එහි ශෘංගාරාත්මක භූ දර්ශනය, මනස ඇවිස්සීමේ කඳු, හරිත පැහැබර වනාන්තර, කඳුකර බිම්වටා ඇති සශ්‍රීක තේ, උද්‍යාන සහ රන්වන් වෙරළ තීරයන් සහිත පරිසරය සොබාදහම විසින් මිනිසාට දායාද කොට ඇත. සුන්දරත්වයෙන් හෙබි පරිසරය මිනිසාම තම අභිප්‍රායන් මුදුන්පත් කරගනු පිණිස විනාශකර දමනු ඇත. පරිසරය වටා බැඳෙමින් ජීවත්වන මානවයා විසින් පරිසරය ආරක්ෂා කළ යුතුය. බුදු දහම වුවද පරිසර හිතකාමී දර්ශනයක් බැවින් පරිසර කළමනාකරණය පිළිබඳ උගන්වා ඇත. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව වශයෙන් පරිසර සංරක්ෂණය පිණිස බෞද්ධ ඉගැන්වීම් හි දායකත්වය කෙතෙක් දුරට උපයෝගී වනවාද යන්නයි. පරිසරයේ වටිනාකම වටහා දෙමින්, බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පරිසර සංරක්ෂණය කළ හැකි ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වශයෙන් පෙන්වා දිය හැකිය. මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ, වර්තමානයේ සීඝ්‍ර ලෙස පරිසර හානි සිදුවන බැවින්, එම පරිසර හානි අවමකර ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම්වල අන්තර්ගත කාරණාවන් ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි ජනතාව දැනුවත් කිරීමයි. මෙම පර්යේෂණයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස, ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණය භාවිතා කොට ඇත. එහි දී ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය යන සාහිත්‍ය මූලාශ්‍රය විමර්ශනය කිරීමත්, ප්‍රමාණාත්මක වශයෙන් වාර්තාගත තොරතුරු හා ප්‍රශ්ණාවලි මඟින් දත්ත රැස් කිරීමත් සිදු කොට ඇත. පරිසරය වූ කලී මිනිසා හා එකට බැඳී පවතින්නකි. මිනිසාට පරිසරයත්, පරිසරයට මිනිසාත් නොමැතිව ජීවත්වීමට හෝ රඳා පැවතීමට නොහැකිය. නමුත්, අතීතය හා වර්තමානය දෙස බැලූ කළ පෙරට වඩා අද වන විට විශාල වශයෙන් පරිසර හානි සිදු වී ඇත. එහි දී 2000 ට පෙර කාළය අතීතය ලෙසත්, 2000 ට පසු කාළය වර්තමානය ලෙස ගෙන ප්‍රමාණාත්මක වශයෙන් දත්ත විශ්ලේෂණය කිරීමේ දී ප්‍රකට වන්නේ පෙරට වඩා වර්තමානය එනම්, 2000 ට පසු කාළය තුළ පරිසර විනාශයන් සිදුවන ප්‍රතිශතය ඉහළ බවයි. බුදුරදුන් පරිසරවේදියෙකු, පරිසර හිතකාමියෙකු වූ බැවින් බුදු දහම ජීව හිතකාමී දහමකි. උන්වහන්සේ පරිසරය මුල්කරගෙන ජීවත් වූ බැවින් සූත්‍ර දේශනාවන්හි පරිසර සංරක්ෂණය පිළිබඳ දේශනා කොට ඇත. භික්ෂූන්හට විනය නීති පැනවීමේදී පවා පරිසර සංරක්ෂණය හා සම්බන්ධ විනය නීති පනවමින් පරිසරය ආරක්ෂා කිරීමට කටයුතුකර ඇත. එහි දී බුදුරදුන් ජලය, තුරුලතා, ශබ්දය, වාතය, පස ආදි වූ සියළු පරිසර අංගයන් ආරක්ෂා කරගන්නා ආකාරය සූත්‍ර දේශනාවන්හි දක්වා තිබේ. එනිසාවෙන් බෞද්ධ ඉගැන්වීම්වල ඇති කාරණාවන් පිළිබඳ ගැඹුරින් සිතා බලා ක්‍රියාකිරීම තුළින් අතීතයේ මෙන් එනම්, 2000 ට පෙර කාළ සීමාවේ පරිදි පරිසර හානි අවම කොට ස්වභාව සෞන්දර්යයෙන් පූර්ණ වූ රටක්, ලෝකයක් ගොඩනැගිය හැක.

**ප්‍රමුඛ පද** - *පරිසරය, බෞද්ධ, මිනිසා, විනාශය, සංරක්ෂණය*

[1] පාලි බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය maduhanshi123@.gmail.com